# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2086/19 - 2018 අගෝස්තු මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2018.08.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(ix)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

137 වන වගන්තිය යටතේ වූ රීති

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70 ආ වගන්තිය යටතේ පත් කරන ලද නිශ්චිත බලධරයා විසින් එකී විශ්වවිද්‍යාල පනතේ 70ඈ සහ 70ඇ යන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 137 වැනි වගන්තිය යටතේ සාදන ලද රීති.

නිශ්චිත බලධරයා.

2018 අගෝස්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

*රීති*

2014 දෙසැම්බර් මස 02 වන දින අංක 1891/9 දරන *අති විශෙෂ ගැසට්පත්‍රය* මගින් අවසන්වරට සංශෝධිත 2013 අගෝස්තු මස 22 වන දින අංක 1824/21 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබූ 2013 අංක 1 දරන නිශ්චිත බලධරයාගේ (උපාධි ප්‍රදානය කිරීමේ ආයතන වශයෙන්, ආයතනය පිළිගැනීමට අදාළ බලතල) රීති පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

1. 2 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"2. මෙම රීතිවල III වැනි උපලේඛනය යටතේ සපයා ඇති ආකාරයට සැකසුම් ගාස්තුවක් ගෙවීමෙන් පසු මෙම රීතිවල I වැනි උපලේඛනයේ සහ II වැනි උපලේඛනයේ සඳහන් මාර්ගෝපදේශ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් යම් රාජ්‍ය හෝ රාජ්‍ය නොවන ආයතනයක් පිළිගැනීම සඳහාත්, එම ආයතනය විසින් උපාධියක් හෝ උපාධි පිරිනැමීම සඳහා වූ බලතල ලබා ගැනීම සඳහාත් අදාළ විය යුතු ය.".

2. 7 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

"7. (මෙහි මින් මතු "ඉල්ලුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් පිළිගැනීම ලබා ගැනීමට අදහස් කරන සහ උපාධියක් හෝ උපාධි ප්‍රදානය කිරීමේ බලය ලබාගැනීමට අදහස් කරන යම් ආයතනයක් විසින් ආයතනික සමාලෝචන සහ විෂය සමාලෝචන සඳහා I වැනි උපලේඛනයේ සහ II වැනි උපලේඛනයේ සඳහන් පරිදි මාර්ගෝපදේශවල ලබා දී ඇති විස්තර ඇතුළත් ව හා III වැනි උපලේඛනයේ සඳහන් සැකසුම් ගාස්තුව ගෙවීමෙන් පසු I වැනි කොටස හා II වැනි කොටස ලෙස කොටස් දෙකකින් සමන්විත ඉල්ලීමක් නිශ්චිත බලධරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

1A - PG 4190 — 507 (2018/08)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

3. 14 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

''14. පළමු සමාලෝචනයේ දී ආපසු යවන ලද ඉල්ලීම, එසේ ආපසු යවන ලද දින සිට මාස තුනක කාලයක් ඇතුළත අවශ්‍ය තොරතුරු සමග ඉල්ලුම්කරු විසින්, නිශ්චිත බලධරයා වෙත නැවත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉල්ලීම පළමුවරට නැවත ඉදිරිපත් කිරීම සඳහා කිසිදු සැකසුම් ගාස්තුවක් අය නොකළ යුතු ය. I වැනි උපලේඛනයේ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූල විය යුතු ය. නිශ්චිත බලධරයා එසේ ඉදිරිපත් කරන ලද ඉල්ලීම නැවත සලකා බැලීම සඳහා එස් සී ඒ කිව් ඒ වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.''.

4. 20 වන රීතිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

''20. ඉල්ලීම ආපසු යවන ලද දින සිට මාස තුනක කාලයක් ඇතුළත සහ මෙම රීති වල II වැනි උපලේඛනයේ නිශ්චිතව සඳහන් නියමයන්ට අනුකූලව, ඉල්ලුම්කරු විසින්, අවශ්‍ය තොරතුරු සමග ඉල්ලීම නිශ්චිත බලධරයා වෙත නැවත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. ඉල්ලීම පළමුවරට නැවත ඉදිරිපත් කිරීම සඳහා කිසිදු සැකසුම් ගාස්තුවක් අය නොකළ යුතු ය.''.

5. 34 වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් කොටස IV වන කොටස ලෙස ඇතුළත් කිරීමෙන් :-

### ''IV වන කොටස

### සැකසුම් ගාස්තුව

35. මෙම රීතිවල III වන උපලේඛනයේ සඳහන් පරිදි ආයතනික සමාලෝචන හා විෂය සමාලෝචන, සැකසුම් ගාස්තුවකට යටත් විය යුතු ය.

36. නියමයන් සමග අනුකූල නොවන යම් උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක්, දෙවන හෝ අනුගාමී සමාලෝචනවලදී, III වන උපලේඛනයේ (ආ) අයිතමයේ නිශ්චිතව සඳහන් සැකසුම් ගාස්තුවෙන් සියයට පනහක (50%) ගෙවීමකට යටත් විය යුතු ය.

37. අධ්‍යයන වැඩසටහන වෙනත් ස්ථානයක පවත්වනු ලබන අවස්ථාවක දී, එම ස්ථානය ඇගයීම සඳහා ආයතනික සමාලෝචනයට අයකරනු ලබන සැකසුම් ගාස්තුවෙන් සියයට විස්සක (20%) අමතර ගාස්තුවක් අයකරනු ලැබිය යුතු ය.''.

6. 35 වන රීතිය, 38 වන රීතිය ලෙස නැවත අංකනය කිරීමෙන්,

7. නැවත අංකනය කරන ලද 38 වන රීතියේ ''නිශ්චිත බලධරයා'' යන යෙදුමේ අර්ථකථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථකථනය ආදේශ කිරීමෙන් :-

'' ''නිශ්චිත බලධරයා'' යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 70ආ වගන්තිය යටතේ නිශ්චිත බලධරයකු වශයෙන් පත්කරනු ලබන තැනැත්තකු අදහස් වේ;''.

8. II වැනි උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමෙන් :-

### *III වැනි උපලේඛනය*

(අ) ආයතනික සමාලෝචනය සඳහා වූ සැකසුම් ගාස්තු රු. 1,200,000.00

(ආ) විෂය සමාලෝචනය සඳහා වූ සැකසුම් ගාස්තු පහත පරිදි වේ :-

| *ශ්‍රී ලංකා සුදුසුකම් සැලැස්වීමේ (එස්. එල්. කිව්. එෆ්) මට්ටම* | *සුදුසුකම් වර්ගය* | *අයකළ යුතු මුදල් ප්‍රමාණය (රුපියල්)* |
|---|---|---|
| එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 12 | ආචාර්ය උපාධිය (පී. එච්. ඩී) | 750,000.00 |
| එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 11<br>එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 10<br>එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 9 | දර්ශනපති උපාධිය හා<br>ශාස්ත්‍රපති උපාධිය | 600,000.00 |
| එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 8<br>එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 7<br>එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 6<br>එස්. එල්. කිව්. එෆ් මට්ටම් අංක 5 | පශ්චාත් උපාධි ඩිප්ලෝමාව<br>පශ්චාත් උපාධි සහතික පත්‍ර<br>ගෞරව ප්‍රථම උපාධිය<br>ප්‍රථම උපාධිය | 500,000.00 |

09 - 332

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.